# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1424/2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 14/11/2023<br>පැය 1620 |

## මාධ්‍ය නිවේදනය

**බාලවයස්කාර දැරියක් නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීමක් - මොරගහහේන පොලිස් වසම.**

2023.11.13 වන දින උදෑසන කාලයේ මොරගහහේන පොලිස් වසමේ ගොඩිගමුව ප්‍රදේශයේ නිවසක සිටි වයස අවුරුදු 07 ක් වූ තම දියණිය පුද්ගලයෙකු විසින් පැහැරගෙන ගිය බවට මොරගහහේන පොලිස් ස්ථානය වෙත දැරියගේ මව විසින් සිදුකල පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

පැමිණිලිකාරිය ඇයගේ ස්වාමි පුරුෂයා, දරුවන් දෙදෙනා, මව හා ස්වාමි පුරුෂයාගේ නැගණිය සමඟ ඉහත නිවසේ පදිංචිව සිටින අතර ස්වාමි පුරුෂයාගේ නැගණිය පුද්ගලයෙකු සමඟ ප්‍රේම සම්බන්ධයක් පවත්වා දැනට ඔහු සමඟ අමනාප වීම හේතුවෙන් නැගණියගේ පෙම්වතා 2023.11.13 වන දින උදෑසන කාලයේ මෝටර් රථයකින් ඇයගේ නිවසට පැමිණ නිවසේ නිදා සිටි දැරියව මෝටර් රථයේ දමාගෙන රැගෙන ගොස් ඇත. පසුව මෙම පුද්ගලයා විසින් ප්‍රේම සම්බන්ධතාවය පවත්වන ලද නැගණිය වෙත දුරකතන ඇමතුම් ලබාගෙන දැරියට කරදරයක් කිරීමට පෙර, ඇයට ඔහු වෙත පැමිණෙන ලෙස දැනුම් දී ඇති බව ද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මේ සම්බන්ධයෙන් මෙ◌ාරගහහේන ස්ථානාධිපති ඇතුළු නිලධාරි කණ්ඩායමක් විසින් CCTV දර්ශණ ඔස්සේ වැඩිදුර විමර්ශන පවත්වමින් සිටියදී ප්‍රේම සම්බන්ධතාවය පැවැත්වූ තරුණිය කැස්බෑව ප්‍රදේශයේදී සැකකරු වෙත පැමිණීමෙන් පසු පැහැරගත් දැරිය සැකකරු විසින් පැමිණිලිකාරියගේ ඥාති නිවසක දමා ගොස් සිටියදි පොලීසිය විසින් සොයාගෙන මව වෙත භාර දීමට කටයුතු කර ඇත.

දැරිය හොරණ මූලික රෝහල වෙත ඉදිරිපත් කර ඇති අතර රැගෙන ගිය කාන්තාව සොයා ගැනීමට සහ සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**